“දේවත්වය විශ්වාස කරන්නෙක් දේවත්වය විශ්වාස කරන්නියක් ගැන කේරා්ධයක් ඇති කරගත නො යුතුය. ඇයගෙන් යම් ගතිගුණයක් ඔහු පිළිකුල් කළේ නම්, ඇයගෙන් වෙනත් දැයක් (ගතිගුණයක්) ගැන තෘප්තියට පත් වනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “දේවත්වය විශ්වාස කරන්නෙක්
දේවත්වය විශ්වාස කරන්නියක් ගැන කේරා්ධයක් ඇති කරගත නො යුතුය. ඇයගෙන් යම්
ගතිගුණයක් ඔහු පිළිකුල් කළේ නම්, ඇයගෙන් වෙනත් දැයක් (ගතිගුණයක්) ගැන තෘප්තියට පත් වනු ඇත" යැයි පැවසූහ. එසේ නැතිනම්, “ඒ හැර වෙන දෙයක්“ (යන පද පෙළින්) පවසා ඇත.“
[صحيح] [رواه مسلم]

ස්වාමි පුරුෂයා තම බිරියට අපරාධ කරන තරමට, ඇය ව අත්හැර දමන තරමට, ඇය ව ප්රතික්ෂේප කරන තරමට ඇය ගැන කේරා්ධය ඇති කර ගැනීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වැළැක්වූහ. අසම්පූර්ණභාවය මිනිසාගේ සහජ ගතියකි. ඇගෙන් යම් නපුරු ගති ගුණයක් ඔහු පිළිකුල් කළ ද ඇය තුළ ඇති තවත් යහපත් ගුණයක් ඔහු දකිනු ඇත. එබැවින් ඔහුට අනුගත වන යහපත ඇගෙන් ඔහු පිළිගත යුතුය. ඉවසා දරා ගත හැකි, ඇගෙන් වෙන්වන තරමට, ඇයව ප්රතික්ෂේප කිරීමට අවශ්ය නැති නපුරු ගුණාංග අතරින් ඔහු පිළි නොගන්නා නපුරු ගුණාංගයක් ඇය මත වී නම් ඒ කෙරෙහි ඔහු ඉවසා සිටිය යුතුය.

http://www.sunnah.global/hadeeth/si/show/3071